කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 15 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මත අවසන් තොගය ගිණුම්ගත කල යුතු වුවද 2017 දෙසැම්බර් 31 දිනට පැවති ආයුර්වේද ඖෂධ තොගයේ වටිනාකම වෙළඳපල වටිනාකම අනුව ගිණුම්ගත කිරීම නිසා එම තොග වටිනාකම රු.64,480 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017ට පෙර වර්ෂවලදී ආපසු ගෙවා තිබූ නමුත් තැන්පත් ගිණුමට සටහන් නොවූ ගෙවීම්, නිවැරදි කිරීමේදී ආරම්භක ශේෂය තුල නොතිබුණු රු.4,591,883 ක් ගිණුමින් කපා හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට අගරු චෙක්පත් ගිණුමේ ශේෂය නිවැරදි කිරීම සඳහා වැරදි ජ'නල් සටහන් තැබීම නිසා රු.341,405 කින් අගරු චෙක්පත් ගිණුම අඩුවෙන් හා සමුච්චිත අරමුදල් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් ලැබීම් සඳහා වූ දුන් වට්ටම් වටිනාකම රු.2,864,805 ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම නිසා එම වටිනාකමින් ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තය වැඩියෙන් හා සමුච්චිත අරමුදල් ගිණුම අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඉ) ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමේ ආරම්භක ශේෂයෙහි 2016 වර්ෂයට ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයක් පමණක් ඇතුලත් වී තිබුණද, ප්‍රවර්තන වර්ෂයේදී 2014 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.1,083,985 ක් ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැර කිරීම නිසා සමුච්චිත අරමුදල් ගිණුම හා ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේදී නිලධාරින්ට දෙන ලද රු.43,926 ක අත්තිකාරම් මුදල් එම වර්ෂයේදී නොපියවා 2017 වර්ෂයේදී පියවීම ගිණුම්ගත කිරීමේදී එය ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම නිසා රු.43,926කින් වර්ෂයේ වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ප්‍රවර්තන වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.60,409 ක් වූ ඇඟිලි සලකුණු යන්ත්‍රය ප්‍රාග්ධනිත නොකිරීම නිසා එම වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-----------------------

සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව වන්දි ඉල්ලා පවරා ඇති නඩු 04ක් අධිකරණයේ විභාග වෙමින් පැවතුණි. එයින් නඩු 02ක් සඳහා වන්දියේ වටිනාකම නිශ්චයකර නොතිබුණු අතර නඩු 02ක් සම්බන්ධයෙන් රු.600,000 ක වන්දියක් නිශ්චයකර තිබුණි. ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-----------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 ක ශේෂ හා උපයෝගී පොත්/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.37,764,821 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

ලැබිය යුතු ගිණුම්

---------------------

(අ) කොළඹ සංවර්ධන සභාවෙන් ලැබිය යුතු ලෙස දැක්වෙන රු.199,477 ක් 2004 වර්ෂයේ සිට නිරවුල්කර නොගෙන ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2004 වර්ෂයට ලැබිය යුතු විදුලි ගාස්තු රු.207,548 ක් ලබාගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.

-----------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

----------------------------------------

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.22,354,446 ක් වූ ගිණුම් විෂයයන් 05ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ)1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | - | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත් සභාව විසින් වසර 07 කට පෙර ලබා ගත් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 සිට 66 දක්වා | - | වර්ෂය ආරම්භයේදී බලප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් සමීක්ෂණයක්කර බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ 371(5) | 332,000 | 2017 වර්ෂයේදී ලබා දී තිබූ එකතුව රු.332,000 ක් වූ අත්තිකාරම් 12ක් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් නිරවුල්කර නොතිබුණි. |
| (ii) මු.රෙ 571 | 50,000 | තැන්පත්කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු හඳුනාගෙන / විමසීම්කර ආදායමට ගතයුතු වුවද, ටී.බී.ඉලංගරත්න ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා 2016 හා 2015 වර්ෂවලදී තැන්පත් කරන ලද එකතු වටිනාකම රු.50,000 ක් වූ තැන්පතු 10ක් ආදායමට ගෙන නොතිබුණි. |
| (iii) මු.රෙ 1646 | - | සභාවේ වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් පිටපත් සහ මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඇ) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති 18 (I) | - | පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදුවලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා, සභාව විසින් බලප්‍රදේශයේ පැවති නිවාස හා ව්‍යාපාරික ආයතන 1060 කින් කසළ බදු අයකර නොතිබුණි. |
| (ඉ)1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරීයේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | 5,608,253 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින මුදල් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගෙන නොතිබුණි. |

### 1.3.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ප්‍රාදේශීය සභාව ආරම්භයේ සිට 2010 ජූනි 30 දින දක්වා පැවති, එදිනෙන් පසු වසා දැමූ මහජන බැංකු ජංගම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ලෙජරය අනුව මුදල් ගිණුමේ රු.47,233ක හර ශේෂයක් විය. මෙම බැංකු ගිණුම 2010 ජූලි 09 දිනැති බස්නාහිර පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියේ උපදෙස් වලට පටහැනිව අනුමැතියකින් තොරව වසා දමා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මුදල් ශේෂය (පැරණි) රු.47,233 ක් ලෙස දක්වා තිබුණද භෞතිකව එවැනි වත්කමක් සභාව සතුව නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.99,183,339 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 89,048,114 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ) අංක 098-01-002-3-3913965 දරන ගිණුමට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ 2011, 2012 සහ 2013 වර්ෂයන්හි තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.16,669ක චෙක්පත් 03ක් නිරීක්ෂණය විය.

(ආ) සභාව විසින් පවත්වා ගෙන යන බැංකු ගිණුම් 04කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී පිළිවෙලින් එකතුව රු.111,607,900 ක් වූ හා රු.318,072,018ක් වූ එකතු කිරීම් හා අඩු කිරීම් වර්ෂ ගණනාවක සිට නිරවුල් කර ගැනීමකින් තොරව මුදල් පොතට ගැලපීම් කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කිරීම් | රැස්කල ආදායම | 2017 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කිරීම් | රැස්කල ආදායම | 2016 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 54,202,384 | 48,439,066 | 57,976,651 | 60,692,872 | 55,467,503 | 43,663,465 | 45,852,897 | 53,278,074 |
| (ii) කුලී | 3,992,508 | 3,489,440 | 5,497,628 | 2,452,609 | 5,221,055 | 3,157,200 | 4,425,482 | 3,952,774 |
| (iii) බලපත්‍ර ගාස්තු | - | 566,110 | 566,110 | - | 242,715 | 666,060 | 357,710 | 551,065 |
| (iv) වෙනත් ආදායම් | - | 77,306,864 | 77,306,864 | - | - | 92,187,961 | 92,187,961 | - |

2.3.2 වරිපනම් හා බදු

-------------------

(අ) රු.50,000 කට වඩා හිඟ හිටි, පෞද්ගලික අංශයේ දේපළ 06 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ වරිපනම් වටිනාකම රු.63,350 ක් විය.

(ආ) සභා බල ප්‍රදේශයේ පිහිටි රජයේ දේපළ 08 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් වටිනාකම රු.130,610 වු අතර ඉන් දේපළ 05 කට අදාල හිඟ වරිපනම් බදු එම දේපළවල තක්සේරු වටිනාකම වු රු.93,610 ක මුදල ඉක්මවා තිබුණි.

2.3.3 කුලී

-----

(අ) සභාවට අයත් වෙළඳ සංකීර්ණය හා වෙළඳපල 06 ක කඩ 88 කින් හා බක්කි කඩ 28 කින් 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් කුලී හා දඩ ගාස්තු පිළිවෙලින් රු.2,293,799 ක් හා රු.2,567,197 වශයෙන් එකතුව රු.4,860,996 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට එයින් රු.1,491,000 ක් හිඟව තිබුණි.

(ආ) කොටිකාවත්ත නව වෙළඳපලේ කඩ කාමර 03 කින් හා පොදු වෙළඳපලේ බක්කි කඩ 10 කින් 2017 වර්ෂය තුල කිසිදු මුදලක් අයවී නොතිබුනු අතර 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ කුලී හා දඩ ගාස්තු වටිනාකම රු.656,095ක් විය. මෙසේ දීර්ඝ කාලීනව කඩකුලී හිඟහිටි කඩකාමර හා බක්කි කඩ සභාවට පවරාගෙන නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොතටුව පොදු වෙළඳ සංකීර්ණයේ අංක 01 දරන කඩ කාමරය වෙනුවෙන් 2017 ජනවාරි 01 දිනට අයවිය යුතුව තිබු රු.46,675 ක හිඟ කුලිය සහ රු.12,025 ක දඩය ඇතුළුව එකතුව රු.58,700 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනවන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) සෑම කඩ කාමරයක්ම වසර 05 කට වරක් තක්සේරු කර කුලී සංශෝධනය සඳහා කුලීකරු සමඟ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොටිකාවත්ත පොදු වෙළඳසැලේ උඩුමහල් නිවාස සංකීර්ණයේ පිහිටි නිවාස 10 කින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලී හා දඩ ගාස්තු වල එකතුව රු.441,076 ක් විය. 2017 වර්ෂයේදී හිඟ කුලී අයවීම, අයවිය යුතු මුළු කුලී වටිනාකමින් 25%ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් වූ අතර නිවාස 03 කින් කිසිදු හිඟ කුලියක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) කොටිකාවත්ත අඩුකුලී නිවාස සංකීර්ණයේ පිහිටි කුලී නිවාස වලින් ප්‍රවර්තන වර්ෂය තුලදී කිසිදු හිඟ කුලියක් හෝ ප්‍රවර්තන වර්ෂයට අයවිය යුතු කුලිය අයකර ගෙන නොතිබුනු නිවාස 05 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට එම නිවාස වලින් අයවිය යුතු හිඟ කුලී හා දඩ ගාස්තු වල එකතුව රු.291,065 ක් විය. 2018 මැයි 22 දිනට තවදුරටත් අයවිය යුතු හිඟය රු.262,565 ක් විය.

(උ) කොටිකාවත්ත වෙළඳ සංකීර්ණයේ පිහිටි නිවාස 38 ක කුලී අයකිරීම සඳහා 1997 වර්ෂයේදී රජයේ තක්සේරුකරු විසින් නිකුත් කර තිබු තක්සේරුව පදනම් කරගෙන තිබුණි. රජයේ තක්සේරුකරු විසින් 2015 අප්‍රේල් 10 දින නවකුලී තක්සේරුවක් එවා තිබුනද, ඊට අනුකූලව ඉහත නිවාසවල කුලී සංශෝධනයක් කර, අදාල බදු ගිවිසුම් වලට එළඹීමට හා ඒ අනුව කුලී ආදායම් අයකර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා 2015 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව රු.4,254,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඍ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කුලී පදනම මත ලබා දී තිබු දේපළක් 2013 වර්ෂයේදී සභාව වෙත නැවත පවරාගෙන තිබුනද එදිනට ලැබිය යුතු රු.220,282 ක කුලී වටිනාකමක් හා රු.28,510 ක දඩ ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ රු.41,000,000 ක් හා මුද්දර ගාස්තු රු.137,266,799 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
------------------

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමු කර්තව්‍යයන්
-------------------------------

(i) සභාව විසින් පිළියෙල කර තිබුනු 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව බල ප්‍රාදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 30 ක් ඇස්තමේන්තු කර තිබුණි. සභාව විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව 2017 වර්ෂයේ නිමකල කර්මාන්ත 56ක සත්‍ය පිරිවැය රුපියල් මිලියන 18.6 වු අතර ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 8.3ක් වු කර්මාන්ත 16 ක් ප්‍රතිපාදන නොමැති වීම නිසා අතහැර දමා තිබුණි.

(ii) විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක වැඩසටහන 2017 යටතේ ඇස්තමේන්තු වටිනාකම රු.3,862,908 ක් වු කර්මාන්ත 06ක් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍ය | කර්මාන්ත සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තු වටිනාකම රු. | නිරීක්ෂණ |
|---|---|---|---|
| ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් | 04 | 2,880,077 | ප්‍රදේශවාසීන්ගේ විරෝධතා |
| සුබිත පුරවර කුඩා නගර සංවර්ධන ව්‍යාපෘති යෝජනා | 02 | 982,831 | ප්‍රදේශවාසීන්ගේ විරෝධතා සහ ව්‍යාපෘති නාමය සම්බන්ධයෙන් ඇති වු ගැටළු |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------------

(i) වර්ග කිලෝ මීටර් 29.6 ක වර්ග ප්‍රමාණයකින් යුත් සභා බල ප්‍රදේශයේ එකතු කරන කසළ, අක්කර 3.7 පමණ වගුරු බිමකට බැහැර කර, දිරන කසළ උපයෝගී කරගෙන කොම්පෝස්ට් නිපදවීම සිදුකර තිබුණි. මෙහිදි කසළ නිසි ලෙස තෝරා බැහැර කිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ii) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 6 වන පරිච්ඡේදයේ 59 වැනි ඡේදය පරිදි සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ මැදිහත්වීම අනුව කාබනික අපද්‍රව්‍ය සඳහා ජීව වායුව, කොම්පෝස්ට්කරණය හෝ වෙනත් ප්‍රායෝගික තාක්ෂණික ක්‍රම සංවිධානය කල යුතුය. ඒ අනුව සභාව විසින් කොම්පෝස්ට් අංගනයක් පවත්වාගෙන ගොස් තිබුනද එය බල ප්‍රදේශයේ සමස්ථ දිරන කසළ කොම්පෝස්ට්කරණය සඳහා ප්‍රමාණවත් නොවූ අතර කොම්පොස්ට් අංගනය පුළුල් කිරීම හෝ කසළ උපයෝගී කරගෙන ජීව වායු නිපදවීම හා/හෝ වෙනත් තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

---

(අ) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ 2016 දෙසැම්බර් මිලදීගත් වටිනාකම රු.80,275 ක්වූ පාවහන් යුගල 95ක් අපේක්ෂිත කාරණය සඳහා යොදවා නොගෙන මාස 17ක කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. 2018 මාර්තු 09 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ඉතිරිව තිබිය යුතු පාවහන් යුගල 95න් සභාව තුල පැවතියේ පාවහන් යුගල 86 ක් පමණි. ඒ අනුව රු.7,605ක් වටිනා පාවහන් යුගල 09ක් අස්ථානගත වී තිබුණි.

(ආ) දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණින් ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයන් 10 දෙනෙකු වෙත ලබා දී තිබූ පොප් කෝන් මැෂින් වල පිරිවැය ආවරණය කර ගැනීම සඳහා යන්ත්‍රය ලබා දී මාස 06 කට පසු ඇරඹෙන මාසයේ සිට මාසික වාරික 20 කදී රු.500 බැගින් එකතුව රු.10,000 ක් වන මුදලක් සභාව වෙත අයකර ගත යුතු වුවද සභාව විසින් එම මුදල් අඛණ්ඩව අයකර ගෙන නොතිබුණි. තවද රුපියල් 66,000 ක් වටිනා පොප්කෝන් මැෂින් 02 ක් ගබඩාවේ රඳවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු/අතිරික්ත |
|---|---|---|---|
| මාණ්ඩලික | 03 | 03 | - |
| ද්විතීයික | 41 | 37 | 04 |
| ප්‍රාථමික | 216 | 190 | 26 |
| එකතුව | 260 | 230 | 30 |

(ආ) ප්‍රවර්තන වර්ෂය තුලදී සේවකයන් 04 දෙනෙකු සඳහා දෙන ලද රු.285,248 ක් හා පෙර වර්ෂ වලදී සේවකයන් 06 දෙනෙකුට දෙන ලද රු.534,112 ක් ඇතුළුව එකතුව රු.819,360 ක සේවක ණය මුදලින් සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු ණය වාරිකයක් අයකර ගෙන නොතිබුණි.

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය අනුව පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් / වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා අසාමාන්‍ය විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදා ගෙන නොතිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වැය විෂයයන් 89 ක් සඳහා සළසා තිබූ එකතුව රු.84,110,000 ක් වූ ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 39 ක් වෙනුවෙන් රු.57,111,700 ක් වෙන්කර තිබුණද එයින් සියයට 50 කට වඩා වැය කර නොතිබූ ප්‍රමාණය රු.40,035,295 ක් විය.

5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ගිණුම් වලින් අත්හැරීම් තිබීම.<br>(ii) ගිණුම්වල වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබීම් පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් එකතු කිරීම ප්‍රමාණවත් නොවීම.<br>(ii) නව කුලී තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) මූල්‍ය පාලනය | වර්ෂ ගණනාවක සිට පැවත එන උපලබ්ධි නොවූ චෙක්පත්, මුදල් මාරු කිරීම් නිරවුල් කිරීමකින් තොරව පැවතීම. |
| (ඈ) තොග පාලනය | අවසන් තොග සමීක්ෂණය නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පාලනය | අත්හැර දැමීම් හා ප්‍රමාදවීම් පැවතීම. |